# ලක්දිව සිංහල ස්ථාන නාම භාවිතය අත්‍යවශ්‍යයි!

**ලො**ව කොතැන හෝ වෙසෙන කිසියම් මිනිස් ජාතියක් නියත වශයෙන් තවත් ජාතිය කට වඩා වෙනස්වන්නේ ඔවුන් කතාකරන භාෂාවෙනි. ඉංග්‍රීසීන් ඉංග්‍රීසීන් වන්නේ, ජපනුන් ජපනුන් වන්නේ, ජර්මානුවන් ජර්මානුවන් වන්නේ, දමිළයන් දමිළ වන්නේත්, එසේම සිංහලයින් සිංහලයින් වන්නේත් එලෙසමය. සෑම ජාතියක් සිය බසට මව්බස කියන්නේ එබැවිනි.

## උච්චාරණ ප්‍රභේදය

කවර ජාතියක වුවද ඉස්මතුවී පෙනෙන අනන්‍යතා ලක්ෂණයක් නම් කිසියම් වචනයක් ඒ ජාතිය විසින් උච්චාරණය කරනු ලබන ආකාරයයි. එහිදී ඔවුනට තම මව් භාෂාවෙන් කරන උච්චාරණ ස්වරයෙන් බැහැර වීමට කිසිසේත් හැකි නොවේ.

උදාහරණයක් ගතහොත් ඉංග්‍රීසි ජාතිකයෙකුට කොළඹ යයි කිව නොහැක. එනිසා ඔවුන් කොළඹට කීවේ කොලොම්බු කියාය. ශතවර්ෂ ගණනනාවකට පසු අද වුවද ඔව්හු කලම්බු යයි කියති. ගාල්ලට ගෝල් යයිද, කෑගල්ලට කේගෝල් යයිද, තංගල්ලට ටැංගෝල් යයිද අදත් කියති.

## ස්ථාන නාම දෙමළකරණය හා ඊළාම් සංකල්පයේ උපත

මෙම උච්චාරණ විපරීතභාවය තේරුම් ගැන්මට දෙමළ උච්චාරණයන්ම ප්‍රමාණවත්ය. අප මව්බිමේ අනාදිමත් කාලයක සිට ජීවත්වන දෙමළ බස කතාකරන ඕනෑම දෙමළ ජාතිකයෙකු අපේ වචන එනම් පුද්ගල නාම, ග්‍රාම නාම, ස්ථාන නාම උච්චාරණය කරනුයේ තම මව්බසේ නියත බලපෑම නිසා දෙමළ භාෂා හුරුව රැගත් උච්චාරණයෙනි. කොළඹ යයි කියාගත නොහැකි නිසා ඔව්හු කොළොම්පු යයි කියති. මීගමුවට නීර්කොළාම්පු යයිද, ගාල්ලට ගාලෙයි කියාද, අම්පාරට අම්බාරෙයි ද කියති. සිරිගෝණ කන්දට තිරුකෝණමලෙයි හා සෝමපුරට සාම්පූර් යනුවෙන්ද වහරති. එසේම ඔවුන්ගේ කටට මඩකලපුව මට්ටකොලොප්පුය. කොටහේන කොට්ටච්චේනෙයි ය. ශ්‍රීලංකාවේ කවර හෝ ප්‍රදේශයක ස්ථාන නාම දෙමළ උච්චාරණ ස්වරූපය ගෙන ඇත්තේ මෙලෙසිනි. සිංහළයින් දිගු කලක් තිස්සේ මෙය සැලකූයේ උපේක්ෂාවෙනි.

අභාග්‍යය නම් දෙමළ අයගේ මෙම උච්චාරණ දුෂ්කරතාව නිසා සිදුවූයේ උතුර සහ නැගණහිර පළාත් දෙක දෙමළ නිජ බිමයයි ලොවට හඬගා කියන්නට බෙදුම්වාදී ඊළාම්කාරයින්ට අනගි පසුබිමක් සළසා දීමයි. අවස්ථාවාදී කූට දේශපාලකයෝ හිතාමතාම මෙම සිංහල ස්ථාන දෙමළකරණය කිරීම තහවුරු කළහ. වේගවත් කළහ. සිංහලයාගේ උදාසීන, නිද්‍රොපගත, නොසැලකිලිමත් ජීවන රටාව තුළින් කිසිදු බාධාවක් නොමැතිව උතුරු නැගණහිර දෙමළ ඊළාම් සංකල්පයේ නිර්මාණය ඇරඹිණ.

## නිජබිම සංකල්පයට උඩගෙඩි දීම

වරින්වර අපේ දේශප්‍රේමී විද්වතුන් දේශීය ඉතිහාසඥයින් පුරා විද්‍යාඥයින් විසින් මතුකරනු ලැබ ශ්‍රීලංකාවේ ස්ථාන නාමයන්ගේ නිවැරදි උච්ච්චාරණය හා ලිවීම කෙසේ වියයුතුද යන්න අප රටේ දේශපාලකයෝ, පත්‍රකලාවේදීහු සහ දැන උගත් කවුරුත් පාහේ දැන සිටියහ. එහෙත් අද වනතුරු නිවැරදි ස්ථාන නාම කිසිවෙක් නොලියති. වරින්වර බලයට පත් රජයයන් ද ඒ විකෘති නාම එලෙසම තිබෙන්නට හැරියා විනා නිවැරදි කරන්නට කිසිදු පියවරක් ගත්තේ නැත. එසේම සිංහලයින්ගේ ජාතිගතිය වන ඕනෑම හානියක් සිදුවන්නට හැර ඔහේ ඕනෑ එකක් වුනාදෙන් යයි කරබාගෙන ඉඳීමද අද අප ජාතියේ අභාග්‍යයට මගපාදා තිබෙන බව පැහැදිලිය.

## දෙමළ කොටි ත්‍රස්තවාදීන් සමග කළ මාවිල් ඔය සටන

ගිය වසරේ අගෝස්තු මාසයේ ශ්‍රීලංකාවේ නැගණහිර පෙදෙසේ කැලෑ අරක්ගෙන සිටි කොටි ත්‍රස්තවාදීහු ගෝකන්න සිරිගෝණකන්ද හෙවත් ත්‍රිකුණාමළය දිස්ත්‍රික්කයේ ( ගන්තලාවෙන්) කන්තලේ ඔබ්බෙහි සෝමපුර ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සහ ගොවිතැන් සඳහා ජලය සැපයූ මාවිල් ඔයේ සොරොවු අවහිර කළහ. මේ නිසා ඒ පළාතේ වසන සිංහළ දෙමළ හා මුස්ලිම් ජාතිකයෝ දැඩි පීඩාවට ගොදුරුවූහ. වහා ක්‍රියාත්මක වූ ශ්‍රීලංකා ආරක්ෂක හමුදා දරුණු සටන් වැද ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදීන් පළවා හැර මාවිල් ඔය සොරොව්ව ඇර දිය නැතිව සිටි ජනතාවට දිය ලැබෙන්නට සැළැස්සූහ.

## සිංහළ නාම භාවිතයේ වැදගත්කම ඉස්මතුවේ

අපේ පෙරාණික ස්ථාන භාවිතයේ ඇති වැදගත්කම දැඩි ලෙසින් යළිත් ඉස්මතුවූයේ මේ අවස්ථාවේදීය. කලයාගේ ඇවෑමෙන් අපේ නොසැලකිලිමත්කමෙන් භාවිතයෙන් ඇත්වූ ඉපැරණි මුල් සිංහල ග්‍රාම නාම යළි භාවිතයටත්, උතුරු නැගණහිරින් මැකී යමින් පවතින සිංහළ ලකුණ යළි ප්‍රතිශ්ඨාපනය කිරීමේ වැදගත්කමත් විද්‍යුත් පණිවුඩ හුවමාරු මගින් ලොව පුරා වෙසෙන සිංහල දැහිතැතියන්ගේ විමසුමට හා සාකච්ඡාවට භාජනය වූයේ මේ මාවිල් ඔය පළහිලව්වේදීය. නැතිවී යන සිංහල නම් ගම් පිළිබඳව අපේ විද්වතුන් කලක් තිස්සේ කරන ලද පර්යේෂණ හා එක් රැස්කරන ලද ඓතිහාසික තොරතුරු ඇසුරෙනුත් පැරණි ලේඛන හා පුරාවිද්‍යා පැහැදිලිකිරීම් ඇසුරෙනුත් පැරණි භූගෝලීය සිතියම්ද භාෂාමය උච්චාරණ විධි හා ප්‍රභේදයන්ද සැලකිල්ලට ගෙන විශේෂ අන්තර්ජාල වෙබ් අඩවියක් දැනටමත් නිර්මාණය කර තිබේ.

## සිංහළ ස්ථාන නාම වෙබ් අඩවිය

භාවිතා නොවන නිසා දැන් යටපත්වී ඇති සිංහළ ස්ථාන නාම ඒවායේ ඓතිහාසික හා පුරාවිද්‍යා පසුබිම එම පැරණි සිංහල නම් දෙමළට හැරුණු ආකාරය ඒ ස්ථානයන් හි ජනප්‍රවාද සහ අදාල සිතියම්ද දක්වමින් සකස් වී ඇති මෙකී අන්තර්ජාල වෙබ් අඩවිය එකල විද්‍යෝදය සරසවියේ උපකුලපතිව සිටි ආචාර්ය චන්ද්‍ර ධර්මවර්ධන මහතාගේ පුරෝගිමිත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් සම්පාදනය කරනු ලබයි. දැනට මෙය සකස්කර ඇත්තේ ඉංග්‍රීසි බසින් නමුත් ඉතා ඉක්මනින් එය සිංහළ භාෂාවෙන්ද පළකරන බව සම්පාදකවරු කියති.

එම වෙබ් අඩවියට පිවිසෙන මග මෙසේය.

**http://www.geocities.com/place.names/index.html**

♦ ***ආනන්ද විජේසිංහ*** Lethbridge, **Canada** (මතු සම්බන්ධයි)

## 1 වන පිටුවෙන්
## *හිත ඇත්නම්.......!*

ගැන පාරම්බාන්නට සිටි ප්‍රභාකරන් මේ මුවාවෙන් ඉදිරියට පැමිණ තමිල් චෙල්වන් ගැන ගුණවර්ණනාවක් කළේය. ඔහුට සුදු හුණු ගා සාම පරෙවියෙකු කරන්නට දැන් උන් නොදරන මහන්සියක් නැත. නමුත් මෑග කොටියෙකු ලෙස සිය ජීවිත කාලයේම කටයුතු කර ඇති එසේම ත්‍රස්තවාදයෙන් මළ කිසිදු ලතෙත් බවක් නැති ත්‍රස්තවාදියෙකු පමණක්ම වන තමිල් චෙල්වම් කොතරම් හේදුවත් සුදු කරන්නට බැරි ය.

මෙම ජය අප දේශ හිතෛෂී ජනතාවට මෙන්ම අප වීරෝදාර හමුදාවන් කුල්මත්කරවන ශ්‍රේෂ්ඨ ඉදිරි පියවරකි. එසේම අප ගුවන් හමුදාවද මේ ආකාරයේ ගරිල්ලා ප්‍රහාරයකින් පසුබස්සන්නට බැරිබව ඔප්පු කොට ඇත.

හිනාවෙන ත්‍රස්තවාදියා ලෙස අප රටේ හඳුන්වන තමිල් චෙල්වන්ගේ මළගම පසුගිය දිනවල පැවතිණ. කොටි උන්ගේ පව ජාලයෙන්ද ප්‍රභාකරන් ඇතුළු මහ කොටින්ගේ ප්‍රකාශන වලින්ද උත්සාහගන්නේ මේ අමු ත්‍රස්තවාදියා සාම දූතයෙකු බව ලොවට පෙන්නීමටය. එසේම ලංකා ජන සමාජයේ සිටින සාම කාක්කන්ද මේ මෑගයා පසුගිය කාලයේ සාම සාකච්ඡා මෙහෙයවූවෙකු ලෙසද, ඔහුගේ මරණය ඉදිරියට සාමය ඇතිකරලීමට බාධකයක් ලෙසද පෙන්වන්නට බලති. රජයේ අය කෙසේ වුවද කොටි දිගින් දිගටම සාම සාකච්ඡාවලට ආවේ අවංක සාමයක් අපේක්ෂාවෙන් නොවේ. තවමත් කොටි ව්‍යාපාරය යුද්ධයකින්, ආයුධ බලයෙන් ඊළාමයක් පිටුවන්නට අරමුණු කරගත් ත්‍රස්තවාදී ව්‍යාපාරයකි. බාලසිංහම් රෝගාතුරව මියගියාට පසු ඒ ඌනතාව මැකීමට දමාගත් තමිල් චෙල්වම් එයට පෙර දිගටම ත්‍රස්තවාදියෙකි. ඔහු සාමයක් ඇතිකරලීමට නොව සාමයක් කරා යන ගමන වලක්වන්නට කටයුතු කළ අයෙකි.

චෙල්වන්ට සුදුහුණු ගාන සාම කාක්කන් එකෙක් වත් අනුරාධපුර සිද්ධියේදී කොටින්ගේ එම ප්‍රහාරය සාමයට බාධාවක් වූ බව කීවේ නැත. මේ සාමකාරයින්ගේ කටවල් වැඩකර-වන්නේ කුමන මුදල් දැයි නැවත වරක් තහවුරු කොට ඇත. නෝර්වේකාරයින් ද උන්ගේ නියෝජිතයන්ගේ ප්‍රකාශනද මේ ස්වරූප යෙන්ම කොටි ත්‍රස්තවාදීන්ට සේවය සඳහා යෙදුණ ඒවා වෙති.

එදා උදේ තමිල් චෙල්වන් තම මෑග කොටි සහචර රැලක් සමග සාකච්ඡා කළේ ලෝකයා ගැන සාම කරුණාවෙන් සිංහළ දෙමළ මුස්ලිම් ජනතාවට සෙත සැළසීමටද? නැතිනම් නුදුරු අනාගතයේ දී ම අප සකල ජනතාව මහා විනාශයකට හෙලන වැඩ පිළිවෙලක් සැළසුම් කිරීමටද? එදා ඒ වීර ගුවන් හමුදාව තිතටම ප්‍රහාරයක් දී මුන් රැළ විනාශකර ලීමෙන් අප සැමදෙනම මත මුන් හෙළන්නට සැළසූ විනාශකාරී ප්‍රයත්නයන් අක්‍රිය නොකළේද? එදා ඒ සිදුවන්නට තිබුණු භයානක අනතුරක් වැළැක්වීමක් නොවේද? මේවා අප කල්පනා කළ යුතු ය.

ඉදිරියටද අප යථාර්ථය තේරුම් ගෙන කටයුතු කළ යුතුය. බුදුදහමේ දක්වන්නේද එම දර්ශනයයි. කොටි කවදත් දිගටම දිවා රෑ නොබලා ඔවර්ටයිම් කරමින් අප රට හා ජනතාව ප්‍රපාතයට හෙළීමේ වෛරයෙන් පෙළෙන මෑගයෝ වෙති. උන්ගෙන් සහනයක් කිසිදාක බලාපොරොත්තුවිය නොහැකිය. එසේම මෙම මෑගයින් ගැන අධිතක්සේරු කිරීමෙන්, එසේ නැත්නම් පමණට වඩා ඉහළින් සිතීමෙන්, වළකින අතරම අනෙක් අන්තයට ගොස් අවතක්සේරු කිරීමද, එනම් උන් සුළුවෙන් තැකීමද, නොකළ යුතු ය.

මේ පවතින තත්වයන් ගැන ජනතාව දැනුවත් කිරීම මෙන්ම විමසිල්ලෙන් සිටින ලෙසද දැන්විය යුතුය. දැනටමත් රජය මගින් කරන විස්තර පත්‍රිකා හා මාධ්‍ය ප්‍රචාර මගින් කටුනායක ගුවන් තොටුපළ ප්‍රදේශයේ වෙසෙන ජනතාවට සෝදිසියෙන් සිටින ලෙස දන්වා ඇත. කොටි දුර්වලව සිටිනවායයි අප නොසිතිය යුතුය. මුළු ජනතාවම සීරුවෙන් සිටිය යුතු කාලයකි මේ. ඉදිරිය කෙබඳු වේදැයි අපට නොපෙනේ. ගුවන් තොටුපළ පමණක් නොව රටේ කේන්ද්‍රස්ථාන සියල්ල පිළිබඳව හැම පැත්තකින්ම විමසිලිමත්වන ලෙස ජනතාවට කිවයුතුය.

නිරන්තරව විමසිලිමත්වීම නිදහසේ ජීවත්වීම සඳහා අප ගෙවිය යුතු වන්දියයි කියමනක් ඇත. එය මෙනෙහි කොට අප කවුරුත් ශ්‍රීලංකාවේ නොව ලොව කොහි සිටියත් ඒ අනුව කටයුතු කිරීම යහපත පිණිසම හේතුවනවා ඇත.

## Topless - Flip-Flop

## *පටි කිසිවක් නැති සෙරෙප්පු*

**මේ වෙළඳ පොලට දැන් පැමිණ ඇති අළුත්ම විලාසිතාවේ පා සැරසුමයි**

Cool design!! The topless flipflop - a sandal with no straps and no apparent way of staying on your foot. The secret is the tacky water-based glue that keeps the foamy sole in place but does not come off on skin.

In the two weeks since the sandals have gone on sale - under the slogan "flip-flops that don't flip or flop" - an astonishing 3,000 pairs have been sold, despite minimal publicity.

"They do need more tender loving care than the usual sandal - a regular brush in soapy water to keep them sticky. And they work more easily with girls rather than heavy men, although mine are still working."

The flip-flops, which come in five designs, including beach, rainforest and aloha sunset, cost £12.50 each and are available in three sizes - small, medium and large.

Invented in the U.S. and made in China, they have already proved a hit in Australia and Canada, where thousands of pairs have been sold.



## මිනිසා ලොව පහළ නොවූයේ නම්.........

**පෘ**ථුවියේ උස් මුදුන්, ධ්‍රැවාසන්න පෙදෙස් හා කාන්තාර හැර ගොඩබිම අන් සියළුම ස්ථාන නිල්වන් ශාක ආවරණයෙන් බබළනු ඇත.

පෘථුවියේ සෑම පරිසර පද්ධතියක්ම ස්ථිර ජෛව විවිධත්වයකින් යුක්තව පවතී.

පරිසරයට හැඩගැසුණු කිසිම ජීව විශේෂයක් වඳවී යන්නේ නැත. විවිධ ජෛව විශේෂවල සංඛ්‍යා අතර ස්ථිර අනුපාතයක් ඇත. එනම් ජීවීන් අතර තුල්‍යතාව නොනැසී පවතී.

වැස්ස, නියඟ, කුණාටු, උණුසුම හා සිසිලස වැනි දේශගුණික සාධක නියමිත කාලවලදී පමණක් අදාල ප්‍රදේශවල ඇතිවේ.

තද වර්ෂාවකින් පසුව පවා බොර පැහැති ජලය දක්නට නැත. ඇල දොළ, ගංගා, විල් පොකුණු ආදියෙහි ජලය වියලි කාල වලදී පවා අඩුවන්නේ මඳ වශයෙනි.

වගුරුබිම් ඇතුළු කිසිදු තෙත් බිමක් ගොඩවන්නේ නැත.

වායුගෝලයේ විවිධ වායුවල සංයුතිය ස්ථිරය. වාතය ජලය හෝ පස ජීවීන්ට අහිතකර රසායනික ද්‍රව්‍ය වලින් දූෂණය වන්නේ නැත.

මනාව පිහිටා ඇති ඕසෝන් ස්තරය මගින් හිරුගෙන් නිකුත්වන අහිතකර පාර ජම්බූල කිරණ පෘථුවියට ඒම වළක්වයි.

පෘථුවි වායුගෝලීය උෂ්ණත්වය නියත අගයක පවතී. එබැවින් හරිතාගාර ආවරණයක් සිදු නොවේ.

කැලි කසල කිසිම තැනක දක්නට නැත.

**විශ්‍රාම ලත් විදුහල්පති**
♦ **එස්. ජයසුන්දර**
**උඩුගම Sri Lanka**

## කර්තෘට ලියුම්

**මේ** ලියන්නේ ඊයෙ පෙරේදා ලංකාවේ පුවත්පත් කියවා අපට දැන ගන්නට ලැබුණු දෙයක් ගැනයි. කොටි ත්‍රස්තවාදී සංවිධානයට ලංකාවේ ඕනෑම පළාතක ඡන්දය ඉල්ලිය හැකි බවත්, එල්ටීටීඊය දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගන්නා බවත් රජයේ ඇමතිවරයෙකු කියා තිබෙනවා දැක්කෙමු. අප අහන්නේ හැබෑටම මේ කියන ඇයින්ට පිස්සුද? මොළේ කළඳක්වත් තිබෙනවාද? ඔළුව අතගා අං තියනවාද කියාත්, පස්ස පැත්ත අතගා වලිගය පොඩ්ඩක් හෝ ඇත්දැයි බැලීම ද වටී. කොටියන් මේ කරන විනාසෙ හැටියට උන් සමූලඝාතනය කරනවා මිසක් චන්දෙ ඉල්ලන්න දෙනවාද?

මේ ගොන් නායකයින් කොටි සංවිධානය තහනම් කරන්නේ නැතිව දැන් උන්ට ජන්දෙ දෙන ලෙසත් ජනතාවට කියයි. උන් තහනම් කරන්නය කියන්නේ ලෝකයාටයි

ඇමතිවරුනි, ඉන්න බැරි නම් අස්වෙලා යනව මිසක් අමු ගොන් කතා කියන්න එපා. ජනතාවට අපහස කරන්න එපා. ලෝකයාට කියා ලංකාවට හින ස්සවන්න එපා !

♦ ***මර්වින් සිගේරා*** Cheam Surrey **UK**